JSS 2026 4(1): 245-265

Journal of Social Sciences (JSS) - NISD
Volume 04 – Issue 01
DOI: https://doi.org/10.4038/jssnisd.v4i1.68

**14**

# THE CONTRIBUTION OF DERRIDEAN DECONSTRUCTION TO THE PROGRESS OF ART

## ඩෙරීඩියානු විසංයෝජනය කලාවේ ප්‍රගමනයට දැක්වූ දායකත්වය

**A.A. Shammi Ishara Amarakoon**

Department of Philosophy, Faculty of Social Sciences, University of Kelaniya, Sri Lanka
Email: shammi.ishara3232@gmail.com

## ABSTRACT

*This study examines the contribution of Jacques Derrida's theory of Deconstruction to the criticism of art, literature, and culture within the philosophical framework of postmodernism. Postmodernism emerged during the twentieth century as an alternative intellectual movement to modernism, critically challenging established notions of absolute truth, fixed meaning, binary oppositions, and systems of knowledge structured by power. Within this philosophical context, Derrida's concept of deconstruction argues that a text or work of art does not possess a single, fixed, or ultimate meaning. Instead, meaning is continuously constructed and reconstructed through language, context, and the interpretations of readers or viewers. This research adopts a qualitative research methodology and is based on conceptual analysis, literature review, and comparative analysis. The primary objectives of the study are to identify the fundamental philosophical characteristics of deconstruction, analyze its role in the criticism of art and literature, explain the transformation of the concepts of meaning and truth in postmodern society, and evaluate the contribution of deconstruction to the development of art. Deconstruction challenges traditional artistic conventions, fixed interpretations, and creative boundaries by encouraging the production of new meanings, multiple interpretations, critical readings, and audience-centered approaches to interpretation. As a result, it has enabled contemporary artists to explore innovative aesthetic practices, transcend conventional artistic limitations, and present artworks as open systems of meaning rather than closed and definitive expressions. Consequently, deconstruction has significantly influenced the development of contemporary art by promoting experimentation, interpretive plurality, and critical engagement. Therefore, this study*

*concludes that deconstruction is a major philosophical approach within postmodern thought that has introduced new critical perspectives and research directions in the fields of art, literature, and cultural studies.*

***Keywords :*** *Art Criticism, Deconstruction, Interpretational Analysis, Jacques Derrida, Postmodernism.*

**සාරසංක්ෂේපය**

මෙම අධ්‍යයනය පශ්චාත් නූතනවාදී දාර්ශනික පසුබිම තුළ ජැක් ඩෙරීඩාගේ විසංයෝජනවාදී සංකල්පය කලා, සාහිත්‍ය සහ සංස්කෘතික විචාරය සඳහා දායක වන ආකාරය විග්‍රහ කරයි. පශ්චාත් නූතනවාදය 20 වන සියවසේ නූතනවාදී චින්තනයට විකල්ප ප්‍රවණතාවක් ලෙස බිහි වූ අතර, සම්මත සත්‍ය, ස්ථාවර අර්ථ, ද්විත්ව විරුද්ධතා සහ සමාජය තුළ බලවත් වී ඇති දැනුම් පද්ධති විවේචනාත්මකව ප්‍රශ්න කරයි. මෙම දාර්ශනික පසුබිම තුළ ඩෙරීඩා විසින් ඉදිරිපත් කළ විසංයෝජනවාදය, පාඨයක හෝ කලාකෘතියක තනි, අවසන් අර්ථයක් නොපවතින බවත්, අර්ථය සන්දර්භය, භාෂාව සහ පාඨකයාගේ අර්ථනිරූපණය අනුව නිරන්තරයෙන් වෙනස් වන බවත් පෙන්වා දෙයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම් වන අතර සංකල්ප විග්‍රහය, ග්‍රන්ථ විමර්ශනය සහ සමානතා විශ්ලේෂණය ප්‍රධාන පර්යේෂණ ක්‍රම ලෙස භාවිත කරයි. අධ්‍යයනයේ අරමුණු වන්නේ විසංයෝජනවාදයේ මූලික දාර්ශනික ලක්ෂණ හඳුනාගැනීම, කලා හා සාහිත්‍ය විචාරය තුළ එහි භූමිකාව විශ්ලේෂණය කිරීම සහ පශ්චාත් නූතනවාදී සමාජයේ අර්ථ හා සත්‍ය පිළිබඳ සංකල්පවල සිදුවූ වෙනස්කම් පැහැදිලි කිරීමයි. එසේම, ඩෙරීඩාගේ විසංයෝජනවාදය කලා සංවර්ධනයට ලබාදුන් දායකත්වය ද මෙම අධ්‍යයනයේ විශේෂ අවධානයට ලක් වේ. එම සංකල්පය මඟින් සම්ප්‍රදායික කලා සම්මතයන්, ස්ථාවර අර්ථකථන සහ නිර්මාණාත්මක සීමාවන් අභියෝගයට ලක් කරමින්, නව අර්ථ නිර්මාණයට, විකල්ප කියවීම්වලට, බහුඅර්ථක කලා ප්‍රකාශනයට සහ ප්‍රේක්ෂක කේන්ද්‍රීය අර්ථනිරූපණයට ඉඩ සලසයි. එහි ප්‍රතිඵලයක් ලෙස සමකාලීන කලාකරුවන්ට නව නිර්මාණාත්මක ප්‍රවේශයන් අත්හදා බැලීමට සහ කලාකෘති විවෘත අර්ථ පද්ධති ලෙස ඉදිරිපත් කිරීමට හැකි වී ඇත. ඒ අනුව, විසංයෝජනවාදය කලා, සාහිත්‍ය සහ සංස්කෘතික අධ්‍යයන ක්ෂේත්‍රවල නව විමර්ශන දිශානතියක් හඳුන්වා දුන්, පශ්චාත් නූතනවාදී චින්තනයේ වැදගත් දාර්ශනික ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැකිය.

**මූඛ්‍ය පද :** අර්ථ විග්‍රහය, කලා විචාරය, ජැක් ඩෙරීඩා, පශ්චාත් නූතනවාදය, විසංයෝජනය.

## හැඳින්වීම

පශ්චාත් නූතනවාදය 20 වන සියවසේ එනම් සමකාලීන දර්ශනයේ මෑත කාලයට අයත් දාර්ශනික සංකල්පනාවකි. පශ්චාත් නූතනවාදය නූතනවාදයට විකල්ප වශයෙන් නිර්මාණය විය. සාම්ප්‍රදායික බටහිර පිළිගෙන තිබූ සදාචාර දර්ශනයට එරෙහිවීම පශ්චාත් නූතනවාදය තුළින් දැකගත හැකිය. පශ්චාත් නූතනවාදී දාර්ශනික ව්‍යාපාරයට පසුබිම් වූයේ නූතන සංකීර්ණ සමාජ ක්‍රමයයි. ලෝක යුද්ධ සමග පරිසර දූෂණය, ජනවාර්ගික ගැටලු, ආහාර හිඟය, ප්‍රබල ආගමික මතවාද, සෝවියට් හා චීන දේශපාලනික බලපෑම, නිදහස් ආර්ථික ව්‍යාපාරයේ ව්‍යාප්තිය සහ මානව හිමිකම් උල්ලංඝනය ඒ අතර වැදගත් වේ. මේ කාලයේදී කලාව, සාහිත්‍ය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය දෙසට වැඩි අවධානයක් යොමු විය. පශ්චාත් නූතනවාදී දාර්ශනිකයෙක් මෙන්ම පශ්චාත් ව්‍යූහවාදියෙක් වන ජැක් ඩෙරිඩා මේ යුගයේ ප්‍රබල සාමාජිකයෙකි. ඔහු ඉදිරිපත් කළ ප්‍රධාන සංකල්පනාව වන ඩෙරිඩාගේ විසංයෝජනය තුළින් සමාජය හා සංස්කෘතිය මෙන්ම සාහිත්‍ය විචාරය කිරීම පිළිබඳ දාර්ශනික විමසුමක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වේ.

### පශ්චාත් නූතනවාදය

පශ්චාත් නූතනවාදය යනු 21 වන සියවසේ විවිධ ක්ෂේත්‍රවල සාකච්ඡාවට ලක් වූ මාතෘකාවකි. මෙම සංකල්පය ප්‍රචලිත වූයේ 1980 දශකයේදීය. “Postmodernism” යන ඉංග්‍රීසි වචනයට පර්යාය සිංහල වචනය වන්නේ පශ්චාත් නූතනවාදය යන්නයි. ඊට අමතරව පශ්චාත් නව්‍යවාදය, පසු නවාදය, පසු නූතනවාදය වැනි යෙදුම්ද ඉදිරිපත් කළ හැකිය.

“Postmodernism” යන්නෙහි නිරුක්තිය, post + modern + ism ලෙස දැක්විය හැකිය. post යන්නෙන් පශ්චාත් යන අර්ථයත්, modern යන්නෙන් නූතන යන අර්ථයත්, ism යන්නෙන් වාදය යන අර්ථයත් නිරූපණය කළ හැකිය. පශ්චාත් නූතනවාදය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන ලෙස,

පශ්චාත් නූතන විශ්වකෝෂය පශ්චාත් නූතනවාදය හඳුන්වන්නේ නූතනවාදයට එරෙහි සාහිත්‍ය කලා හා ගෘහ නිර්මාණ වැනි ක්ෂේත්‍රවල ඇති වූ ප්‍රවණතාවයකි.

හයිපර් ශබ්දකෝෂයට (Hyper Dictionary) අනුව නූතනවාදයට එරෙහිව මතු වූ ක්‍රියාවලියකි.

වර්ඩ් අයි කියු ශබ්දකෝෂය ඉදිරිපත් කරන නිර්වචනය වන්නේ නූතනවාදයට පසු, ඊට එරෙහිව මතු වූ කලාත්මක දාර්ශනික හා සංස්කෘතික ක්‍රියාවලියකි යන්නයි.

බ්‍රිටැනිකා විශ්වකෝෂයට (Britannica Dictionary) අනුව ද පශ්චාත් නූතනවාදය ගොඩනැගෙන්නේ නූතනවාදයට එරෙහි ව්‍යාපෘතියක් ලෙසයි.

මහාචාර්ය ඊගල්ටන් පවසන්නේ පශ්චාත් නූතන යුගය යනුවෙන් ඓතිහාසික අවස්ථාවක් නොමැති බවත්, පශ්චාත් නූතනවාදය යනු නිමාවට පත්වන ක්‍රියාවලියක් නොවන බවත්ය.

කේම්බ්‍රිජ් ශබ්දකෝෂයට (Cambridge Dictionary) අනුව පශ්චාත් නූතනවාදය යනු 1980 හා 1990 කාලය අතරතුර බටහිර රටවල ව්‍යාප්ත වූ චින්තන විලාසිතාවකි. මෙය බහුලව ක්‍රියාත්මක වූයේ ගෘහ නිර්මාණ ශිල්පය, ලේඛන කලාව, රංග කලාව, සංගීතය වැනි විෂයන්හිය.

Acquired meanings නැමති ශබ්දකෝෂයට අනුව පශ්චාත් නූතනවාදය යනු "මෙය සමකාලීන කථා බහේදී නිතරම භාවිතා කරන සංකල්පයකි. එයට අර්ථයක් නොමැත. එය විවිධාකාරයෙන් භාවිතා කිරීමට පුළුවන."

මහාචාර්ය නලින් ද සිල්වා පශ්චාත් නූතනවාදය නූතනවාදයේම දිගුවක් බවයි.

ගුණදාස අමරසේකරට අනුව පශ්චාත් නූතනවාදය නාස්තිකවාදී දර්ශනයක් බවත් පශ්චාත් ධනවාදයේ වහලෙක් ලෙසත් අර්ථ දැක්විය හැකිය.

මහාචාර්ය සුචරිත ගම්ලත් පවසන්නේ පශ්චාත් නූතනවාදය යනු අතිප්‍රතිගාමී විෂඝෝර අන්තර්ගතයක් සහිත චින්තන විලාසිතාවක බවයි.

මේ ආකාරයට ගත් කල පශ්චාත් නූතනවාදය යනු මෙය යැයි ස්ථිරසාර වූ නිශ්චිත නිර්වචනයක් සැපයීම අපහසු වේ. මන්ද යත් මෙම සංකල්පය චිත්‍ර කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, සංගීතය, සිනමාව, සාහිත්‍යය, සමාජ විද්‍යාව, ජන සන්නිවේදනය, විලාසිතා හා තාක්ෂණය වැනි විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර ඇතුළත් වන හෙයිනි. කෙසේ වෙතත් පශ්චාත් නූතනවාදයට (postmodernism) පදනම සකස්වන්නේ නූතනවාදය (modernism) හරහාය.

නූතනවාදය යනු සංගීතය, සාහිත්‍යය හා නාට්‍ය වැනි දේ පිළිබඳවත් සමාජ හා සදාචාර ආකල්ප පිළිබඳවත් පැරණි වික්ටෝරියානු සම්මත අදහස් ප්‍රතික්ෂේප කළ ව්‍යාපාරයකි. මෙහි තවත් දිගුවක් ලෙස පශ්චාත් නූතනවාදය ආරම්භ විය. ලිඛිත සාක්ෂිවලට අනුව පළමුව පශ්චාත් නූතන යන යෙදුම 1870 දී ජෝන් වොට්කින්ස් චැප්මන් නැමති ඉංග්‍රීසි ජාතික චිත්‍ර ශිල්පියා විසින් පළ කරන ලද ලිපියක සටහන් විය. මේ හරහා පසුව 1917

දී රුඩොල්ෆ් පැන්විට්ස් විසින් පළකළ *Die Krisis Kultur* ග්‍රන්ථයේදී පශ්චාත් නූතන යන යෙදුම හමුවිය. මෙහිදී මොහු පශ්චාත් නූතන මිනිසා පිළිබඳ අදහස ඉදිරිපත් කර ඇත.

පශ්චාත් නූතනවාදයට බලපෑ සාධක ලෙස දෙවන ලෝක යුද්ධයේ බලපෑම, මාධ්‍ය වෙත බලය ස්ථාපිත වීම, විද්‍යාවේ හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය, ක්වොන්ටම් භෞතික විද්‍යාව, ශිෂ්‍ය අරගල, ගෘහ නිර්මාණ ශිල්පය වැනි දේවල් දැක්විය හැකිය. පශ්චාත් නූතනවාදයේ පුරෝගාමීන් ලෙස ජැක් ඩෙරීඩා (Jacques Derrida), මිෂෙල් ෆූකෝ (Michel Foucault), ජීන් ෆ්‍රැන්සුවා ලියොටාඩ් (Jean Francois Lyotard), ජීන් බෝඩ්රිලාඩ් (Jean Baudrillard), ජියානි වට්ටීමෝ (Gianni Vattimo), සිග්මන්ට් බෝමන් (Zygmunt Bauman), ෆ්‍රෙඩ්රික් ජේම්සන් (Frederic Jameson), රිචඩ් රෝර්ටි (Richard Rorty) යන අය වැදගත් වේ.

පශ්චාත් නූතනවාදයේ ප්‍රධාන ලක්ෂණ ලෙස ,මහා ආඛ්‍යාන ප්‍රතික්ෂේප කිරීම, පරම සත්‍යයක් නොමැතිය යන විශ්වාසය, අධියථාර්ථය, සංස්කෘතික ප්‍රභේදකරණය (උස් පහත් බව) ප්‍රතික්ෂේප කිරීම, බලය ලබා ගැනීමේ අභිලාෂය, මිනිසා භාෂාත්මක නිර්මිතයන් යැයි පිළිගැනීම, විසංයෝජනය, සංකල්ප පාරිභෝගික භාණ්ඩ බවට පත් කිරීම, අපරිපාටිකත්වය අගයීම, බහුත්වවාදය අගයීම, ඛණ්ඩනය, නාසිස්මය (ස්වරූප රාගය), නොගැඹුරුතාවය අගයීම, තර්ක ශක්තිත්වය බැහැර කිරීම, සමස්තකරණය ප්‍රතික්ෂේප කිරීම, මානවවාදය ප්‍රතික්ෂේප කිරීම, දේශපාලනයේදී ක්ෂුද්‍ර දේශපාලන ක්‍රම අගයීම, ජාතික රාජ්‍යයේ සීමා වියැකීම, ඉතිහාසය ප්‍රතික්ෂේප කිරීම, ලිංගිකත්වය පිළිබඳ සාම්ප්‍රදායික ආකල්ප අභියෝගයට ලක් කිරීම යනාදිය හඳුනාගත හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම් වූ දාර්ශනික හා සංකල්පීය අධ්‍යයනයකි. ජැක් ඩෙරිඩාගේ විසංයෝජන සංකල්පය පශ්චාත් නූතනවාදී දාර්ශනික රාමුව තුළ කලා, සාහිත්‍ය හා සංස්කෘතික විචාරය කෙරෙහි සිදු කළ දායකත්වය විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යයනයේදී දාර්ශනික සංකල්ප, න්‍යායාත්මක අදහස් සහ විචාරාත්මක සාහිත්‍යය ගැඹුරින් විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, පර්යේෂණය අර්ථකථනාත්මක ප්‍රවේශයක් අනුගමනය කරන අතර, විසංයෝජනය මඟින් අර්ථය, සත්‍යය, කර්තෘත්වය, ද්විමය ප්‍රතිපක්ෂය සහ ලෝගෝකේන්ද්‍රවාදය පිළිබඳ සම්ප්‍රදායික අදහස් අභියෝගයට ලක් කරන ආකාරය විග්‍රහ කරයි.

මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ද්විතීය මූලාශ්‍ර මගින් රැස් කර ඇත. ඒ සඳහා පශ්චාත් නූතනවාදය, සාහිත්‍ය විචාරය, කලා විචාරය සහ සංස්කෘතික අධ්‍යයන සම්බන්ධ

ශාස්ත්‍රීය ග්‍රන්ථ, සම සමාලෝචිත සඟරා ලිපි, පර්යේෂණ නිබන්ධන සහ සම්මන්ත්‍රණ පත්‍රිකා භාවිතා කර ඇත.

දත්ත විශ්ලේෂණය සඳහා සංකල්ප විශ්ලේෂණය, සාහිත්‍ය සමාලෝචනය සහ සංසන්දනාත්මක විශ්ලේෂණය යන ක්‍රම භාවිතා කර ඇත. සංකල්ප විශ්ලේෂණය මඟින් අර්ථ විභේදනය, අර්ථ සඳහා සළකුණු යොදා ගැනීම, ද්විමය ප්‍රතිපක්ෂය සහ සම්ප්‍රදායික මතවාදයන්ගේ පැවැත්ම වැනි විසංයෝජන න්‍යායේ මූලික සංකල්ප විග්‍රහ කර ඇති අතර, සාහිත්‍ය සමාලෝචනය මඟින් මේ සම්බන්ධයෙන් පවතින විද්වත් සාකච්ඡා සහ විවිධ දාර්ශනික අදහස් ඇගයීමට ලක් කර ඇත.

**ජැක් ඩෙරීඩා (Jacques Derrida)**

පශ්චාත් නූතනවාදී දාර්ශනික සංකල්පනාව තුළ ඉතා වැදගත් දාර්ශනිකයෙක් ලෙස ජැක් ඩෙරීඩා හඳුනාගත හැකිය. ඔහු 1930-2004 කාලවකවානුව තුළ ජීවත් විය. 20 වන සියවසේ බටහිර දර්ශනයේ පශ්චාත් ව්‍යුහවාදී දාර්ශනිකයෙක් ලෙසද මොහු වැදගත් වේ. මොහුගේ ප්‍රධාන දාර්ශනික විචාරය වන්නේ විසංයෝජනයයි.

ඩෙරීඩා සිය වෘත්තීය ජීවිතය තුළ ග්‍රන්ථ 40ක් පමණ ප්‍රකාශයට පත්කර ඇති අතර ඔහුගේ කෘති මහද්වීපික යුරෝපය, දකුණු ඇමරිකාව මෙන්ම මහද්වීපික දර්ශනය ප්‍රමුඛ වූ සියලු රටවල් පුරා ව්‍යාප්ත විය. දර්ශනය, නීතිය, මානව විද්‍යාව, ඓතිහාසික ලේඛනය, ව්‍යවහාරික වාග් විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝවිශ්ලේෂණවාදය සහ දේශපාලන න්‍යායන් ඇතුළු මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යාවන් කෙරෙහි ඔහු සැලකිය යුතු බලපෑමක් ඇති කළ අතර විශේෂයෙන් මහද්වීපික දර්ශනය, පශ්චාත් ව්‍යුහාත්මකවාදය, විසංයෝජනය යනාදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඩෙරීඩාගේ ප්‍රධාන රචනා ලෙස,

*Of Grammatology (1967), Margin of Philosophy (1972) , Speech and Phenomena (1967)* වැදගත් වේ. මීට අමතරව ඩෙරීඩා විසින් රචිත ග්‍රන්ථ ලෙස, *Writing and Difference (1978), Spurs: Nietzsche's Styles (1979), Dissemination (1981), Positions (1981), Archeology of the Frivolous: Reading Condilac (1987), The Post Card from Socrates to Freud and Beyond (1987), The Truth in Painting (1987) Nietzsche's of Spirit: Heidegger and the Question (1989), Given Time I Counterfeit Money (1992), the postcard (1987), Glas (1986), Psyche: Inventions of the Other (1987) Margins of Philosophy (1982), Acts of Religion (2001), aporias: Dying – Awaiting the "limits of truth" (1993), archive fever: a Freudian impression (1998), politics of friendship (1994), le toucher, jean – Luc Nancey (1998), Specters of Marx (1994)*

ආදිය දැක්විය හැකිය. ආචාර්ය නලින් ස්වාරිස් ඩෙරීඩා හඳුන්වා ඇත්තේ බටහිර සමාජ විද්‍යා චින්තනය උඩු යටිකුරු කළ 20 වැනි සියවසේ පහළ වූ විශිෂ්ට දාර්ශනිකයා යනුවෙනි.

**ඩෙරීඩා ව්‍යූහවාදයෙන් ලැබූ ආභාසය**

පශ්චාත් ව්‍යූහවාදය (Post-structuralism) පශ්චාත් නූතනවාදය පිළිබඳ කෙරෙන කතිකාවතෙහිම තවත් කොටසකි. මෙය 1950 / 1960 දශකයේ ප්‍රංශයේ ඇති වූ බුද්ධිමය, දාර්ශනික හා විචේචනාත්මක සාහිත්‍ය ව්‍යාපාරයකි. ව්‍යූහවාදය තුළින් අර්ථ නිර්මාණය කිරීම සඳහා වාග් විද්‍යාව, මනෝවිද්‍යාව, මානව විද්‍යාව සහ වෙනත් ක්ෂේත්‍රවලින් විශ්ලේෂණාත්මක සංකල්ප භාවිතා කර ඇත. පශ්චාත් ව්‍යූහවාදී දාර්ශනිකයන් ලෙස රෝලන්ඩ් බාත් (Roland Barthes), ජැක් ඩෙරීඩා (Jacques Derrida), මිෂෙල් ෆූකෝ (Michel Foucault), ගිල් ඩෙලූස් (Gilles Deleuze), ජීන් බෝඩ්රිලාඩ් (Jean Baudrillard) යනාදීන් වැදගත් වේ.

ව්‍යූහවාදයේ සමාරම්භකයන් ලෙස ප්‍රංශ ජාතික මානව විද්‍යාඥයෙකු වූ ක්ලෝඩ් ලෙවී ස්ට්‍රාවුස් (Claude Levi-Strauss) සහ රෝලන්ඩ් බාත් (Roland Barthes) වැදගත් වේ. ව්‍යූහවාදයෙහි වර්ධනයට හේතු වූ වැදගත් සාධකයක් වන්නේ ස්විස් ජාතික වාග් විද්‍යාඥයෙකු වූ ෆර්ඩිනන්ඩ් ද සෝෂියර් (Ferdinand de Saussure) විසින් හඳුන්වා දුන් සංඥාර්ථවේදයයි (Semiotics). මෙය ඔහු විසින් රචිත "Course in General Linguistics" නම් කෘතියෙන් අනාවරණය කරයි.

මොහු සංඥාර්ථවේදය මඟින් අදහස් කරනු ලැබුවේ සෑම සංඥාවක්ම නැතහොත් භාෂාවේ යෙදෙන සෑම වචනයක්ම සඳහා හැඟවුම්කාරකයක් (Signifier) සහ හැඟවුමක් (Signified) පවතින බවයි. හැඟවුම්කාරකය යනු අප යමක් හඳුන්වාදීමට භාවිතා කරන ශබ්දයයි. ඊට අදාළව පවතින සංකල්ප රූපය හැඟවුම වේ. මෙහිදී සෑම සංඥාවක්ම සම්මුතික වූවක් වන අතර එය භාෂාව පවතින සංස්කෘතිය තුළට පමණක් සීමා වූවකි. හැඟවුම හා හැඟවුම්කාරකය අතර ස්වභාවික සම්බන්ධයක් නොමැත. එය කෘත්‍රිම, හිතුමතේ මෙන්ම සංස්කෘතික වූ අදහසකි.

සෝෂියර්ට අනුව ගත් කල භාෂාව සම්මුතියකි. වචනයක් හා එම වචනය මඟින් ඉලක්ක වන වස්තුව අතර ඇත්තේ ප්‍රායෝගික භාවිතයක් පමණි. මේ අනුව භාෂාවේ සංකල්පයන් තනි තනිව ගත් කල හිස්ය. භාෂාව සම්බන්ධයෙන් සෝෂියර් තුළ ඇත්තේ ව්‍යූහවාදී

දැක්මකි. සෝෂියර්ගේ සංඥාර්ථවේදී අදහස් බෝඩ්රිලාඩ්, ජුඩිත්, විලියම්සන්, ලියොටාඩ් වැනි අය විසින් ඉදිරියට ගෙන යන ලදී. මොවුන්ගේ ආභාසය ලැබූ ඩෙරීඩා වචනයක අර්ථය අනෙක් වචනයට සාපේක්ෂ වන බව වටහා ගත්තේය. එමෙන්ම කිසියම් වචනයක් භාෂාවට පිටතින් නොපවතින බවත්, එවැනි වචන කිසිදා නිර්මාණය කළ නොහැකි බවත් පෙන්වා දෙමින් ඉතිහාසය හා සංස්කෘතිය ඉක්මවා ගිය වෙනස් වූ දැනුමක් පැවතිය නොහැකි බව පෙන්වා දුන්නේය.

සාම්ප්‍රදායිකව ගත්කල හැඟවුම්කාරකය යන්න කිසියම් නිශ්චිත වූ ලක්ෂණයක් හෝ වස්තුවකි. නමුත් ඩෙරීඩාට අනුව හැඟවුමක් ලෙස යටත් යථාර්ථවාදීව දැකිය නොහැක. ඇත්තේ හැඟවුම්කාරකයන් පමණි. එමඟින් බාහිර යමක් නිරූපණය කිරීම සිදුවේ. එමෙන්ම භාෂාව පවතින්නේ මිනිසාගේ භාවිතය මත බවත් භාවිතයෙන් තොර භාෂා ක්‍රියාකාරීත්වයක් නොමැති බවත් භාෂාවේ අර්ථයත් සාපේක්ෂ වන බවත් ඩෙරීඩාගේ විග්‍රහයෙන් අර්ථ ගැන්වෙයි.

**ඩෙරීඩියානු විසංයෝජනය**

විසංයෝජනය (Deconstruction) යන්න පශ්චාත් නූතනවාදයේ වැදගත් සංකල්පයකි. සංකීර්ණ විචාර සංකල්පයක් ලෙස සැලකෙන විසංයෝජනවාදයේ ආදී කර්තෘවරයා වන්නේ ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු වන ජැක් ඩෙරීඩාය. මොහු විසංයෝජනය නැමති සංකල්පය වර්ධනය කර ගැනීමට උපයෝගී කරගෙන ඇත්තේ මාර්ටින් හෛඩගර්ගේ දේශන මාලාවකි. ඔහු 1927 සම්පාදනය කළ "The Basic Problems Of Phenomenology" නම් කෘතිය තුළිනි. එහිදී දර්ශනයට අදාළ අවස්ථා 03ක් විස්තර කරයි. ඒවා Reduction, Construction, Destruction යනාදියයි.

පසුව Destruction තුළින් Deconstruction යන්න වර්ධනය කරගෙන ඇත. එය ඔහුගේ Of Grammatology (1967) සහ Writing and Difference (1967) වැනි කෘති මඟින් හඳුන්වා දී තිබේ. "මිනිසා භාෂාත්මක නිර්මිතයකි" යන හෛඩගර්ගේ චින්තනයත්, භාෂාව මඟින් අර්ථ දැක්වෙන්නේ විසදෘශ්‍යතාවය (Difference) නැමති ධර්මතාවය මුල් කොට ගෙන යන සෝෂියර්ගේ චින්තනයත්, විසංවාදයෙහි මූලස්ථම්භයෝ වෙති. යනුවෙන් විමල් දිසානායක සිය 'නව විචාර සංකල්ප' නැමති ග්‍රන්ථයේ විසංයෝජනය යන්න හඳුන්වා දී තිබේ.

විසංයෝජනය යනු පරීක්ෂා කරන ක්‍රමවේදයකි. නමුත් කිසි විටෙකත් සත්‍ය සොයා යාමේ අදහසින් පරීක්ෂා නොකරයි. එමෙන්ම කතුවර අපේක්ෂාව හෝ ඓතිහාසිකත්වය නොසලකන්නකි. ඩෙරීඩා පවසන්නේ විසංයෝජනය විශ්ලේෂණයක් හෝ විචාරයක්

නොවන බවයි. ඩෙරීඩාගේ විසංයෝජනය ඇමරිකාව පුරා ව්‍යාප්ත කරලීමට මුල් වූයේ පෝල් ඩි මෑන් (Paul de Man) ය. ඩෙරීඩාගේ මෙම විග්‍රහය ප්‍රපංච විද්‍යාව හා ව්‍යුහවාදය යන දාර්ශනික සම්ප්‍රදායන් හරහා සිදුවිය. ඩෙරීඩාට අනුව මෙයින් සිදුවන්නේ නිරන්තරයෙන් අවධානය යොමු කළ පයීතයන්හි (Texts) කුඩාම දේ සොයා බැලීමයි.

ඩෙරීඩාට අනුව ඕනෑම ලේඛනයක් ලේඛකයාගේ අභිමතාර්ථයට සාපේක්ෂ වේ. මෙයට හේතුව ලේඛකයෙකුට තමාට රිසි පරිදි භාෂාව පාලනය කරන්නට නොහැකි වීමයි. විසංයෝජනයේදී මෙම ගැටලුව සාහිත්‍ය විචාරයෙහි ආරම්භක ස්ථානය ලෙස සැලකේ. විසංයෝජනවාදය භාෂාව ඇසුරු කොටගෙන ප්‍රභවය වන අතර ඉතිහාසය, කලාව, දේශපාලන විද්‍යාව, නීතිය, සංස්කෘතික අධ්‍යයනය වැනි විෂයන් වර්ධනය කරලීම කෙරෙහිද දැඩිසේ බලපායි. නමුත් විසංයෝජනය හුදෙක් භාෂා විශ්ලේෂණයක් පමණි.

ඩෙරීඩාගේ චින්තනය අනුව සෑම භාෂාත්මක නිර්මාණයක්ම එක්තරා ද්විත්වයක් මුල් කරගෙන සම්පාදිතව ඇත. දුක-සැප, අඳුර-එළිය, බුද්ධිය-හෘදය මීට නිදසුන්ය. මෙම ද්විත්වයන්හි එක පදයක් අනෙකට වඩා උසස් කොට සැලකීම සාමාන්‍ය පුරුද්දකි. නිදසුන් ලෙස එළිය අඳුරට වඩා උසස් යන්න එබඳු පිළිගැනීමකි. භාෂාත්මක නිර්මාණවලට මුල්වූ ද්විත්වයන් බැහැර කොට භාෂාත්මක සංකථනයෙහි යථා ස්වරූපය පැහැදිලි කිරීමේ අවශ්‍යතාවය ඩෙරීඩා අවධාරණය කර ඇත.

ඩෙරීඩාගේ විසංයෝජන සංකල්පය පිළිබඳ ඉදිරිපත් කර ඇති විවිධ මත:

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රට අනුව 'විසංයෝජනය' යන්න වැරදි යෙදුමකි. ඔහු Deconstruction සඳහා ලබාදෙන සිංහල වචනය වන්නේ 'ප්‍රත්‍යුත්පාදනයයි'.

බටහිර ඉනියා පශ්චාත් නූතනවාදීන්ට අනුව විසංයෝජනය යනු එක් අතකින් 'විසන්ධර්භීකරණය' තවදුරටත් වර්ධනය කිරීමක් ලෙස සැලකිය හැකිය.

කෙනත් කොම්ප්සන්ගේ මතය වන්නේ විසංයෝජනය සංස්කෘතික ජීවිතය තේරුම් ගැනීම සඳහා අන්තර්ඡේදනය වන පයීතයක් ලෙසයි. සංස්කෘතික විශ්ලේෂණ යනු පයීතයක් කියවීමේදී ඒවා විසංයෝජනය කරමින් හෝ ආඛ්‍යාන සම්පාදනය කොට ඇත්තේ විවිධ පෙළවල් පාඨමය අවයව හා කොටස්වලින් බව පෙන්වා දීම සඳහා ආඛ්‍යානය කොටස්වලට ඛණ්ඩනය කොට බැලීමෙනි.

කණ්ඩායමට අනුව විසංයෝජනය යනු පිටත තිබෙන භෞතික ලෝකය මනසින් ගොඩනගා යළි ඒ සංකල්ප බිඳ දැමීමයි.

පශ්චාත් නූතන විශ්වකෝෂයට අනුව විසංයෝජනය යනු පෙළ කියවීමේ ක්‍රමයකි.

Oxford ශබ්දකෝෂයට අනුව විසංයෝජනය යනු විචාර පූර්වක විශ්ලේෂණ උපක්‍රමයකි.

බ්ලැක්වෙල් (Blackwell) ප්‍රකාශනයක් වන සාහිත්‍ය පාරිභාෂික ශබ්දමාලාව සහ සාහිත්‍ය න්‍යාය පිළිබඳ ශබ්දකෝෂය විසංයෝජනය විචාර ක්‍රමවේදයන් හා විශ්ලේෂණාත්මක විමර්ශන විධියක් ලෙස හඳුන්වයි.

මෙම මතයන්ට අනුව විසංයෝජනය යනු කුමක්දැයි නිශ්චිතව ප්‍රකාශ කිරීම අපහසුය. කෙසේ වෙතත් සරලව ගත්කල, කෙළවරක් නොමැතිව කුඩා කොටස්වලට සත්‍ය සෙවීමේ අරමුණක් නොමැතිව කඩා බැලීම විසංයෝජනය ලෙස දැක්විය හැකිය. විසංයෝජනය සඳහා සංඥානුසාරයෙන් අවතීර්ණ විය යුතු අතර, සංඥා ඇසුරින් ගැළපෙන අර්ථ නොව නොගැළපෙන අර්ථ සොයා විසංයෝජනය කළ යුතුය. එහිදී නිර්මාණයේ නොපවතින හරය කියවීම හා නව අදහස් ඇතුළත් කර ගැනීම වැදගත් වේ.

**ඩෙරීඩියානු විසංයෝජනය පැහැදිලි කිරීමට ඔහු ඉදිරිපත් කළ වෙනත් සංකල්ප**

**කථනය හා ලේඛනය**

ඩෙරීඩාට අනුව වඩා වැදගත් වන්නේ කථනය නොව ලේඛනයයි. මන්ද කථනය සිදුවන අවස්ථාවේදීම ඊට අදාළ අවස්ථාව මත පදනම් වී පැහැදිලි කරගත යුතුය. නමුත් ලේඛනය නොවෙනස්වන සුලු ස්ථාවර දෙයකි. ව්‍යාකරණ ආදිය ආශ්‍රයෙන් ලේඛනය පසුව පැහැදිලි කරගත හැකිය. එමෙන්ම කථනය ඍජුව සිදුවන අතර ලේඛනය තුළින් පාඨකයාව වක්‍රව ද ආමන්ත්‍රණය කරයි. කථනයේදී ලේඛනයේදී මෙන් ව්‍යාකරණවල වෙනස නොපෙනේ. මන්ද කථනයේදී වචනවල වෙනස ග්‍රහණය නොවන බැවිනි.

උදා - තණ (තණකොළ)

තන (පියයුරු)

යන්නෙහි වෙනස කථනයේදී වටහා ගැනීමට අපහසුය. නමුත් ලේඛනයේදී වටහා ගැනීම පහසු වේ. කථනයේදී ආපසු යමක් වටහා ගැනීමේදී එය සන්දර්භයට සාපේක්ෂව සිදු කළ යුතුය. ලේඛනයේදී එවැනි ගැටලු අවම වේ. මේ අනුව ඩෙරීඩා කථනයට වඩා ලේඛනය වැදගත් බව පවසා ඇත.

ලිවීම මෙන්ම මැකීමද ලිවීමෙහි තවත් කොටසකි. මැකීමෙන් සිදුවන්නේ ලියූ දෙය සංස්කරණය වීමකි. ලිවීමේ අරමුණ යමක් ප්‍රකට කිරීමයි. නමුත් මැකීමේ අරමුණ යමක් අප්‍රකටව තැබීමයි. අප්‍රකටව තබන්නේ ප්‍රතිවිරුද්ධ තොරතුරු, අදාළ නැති කරුණු ආදියයි. ඒ අනුව මැකීම යනු ද ලිවීමකි. එමෙන්ම ලිවීම විනිවිද නැත; පැහැදිලි නැත; අහිංසකද නැත. මන්ද යමක් ලිවීමේදී තම පක්ෂපාතීත්වය මත සහෘදයාට ලබා දෙන්නා වූ අදහසෙහි වෙනස්කම් සිදුවිය හැකිය.

උදා - 30 අවුරුදු යුද්ධ කාලයේදී සිංහල පුවත්පත්වල සෙබළ මරණ සම්බන්ධව වාර්තා වූයේ:

- "L.T.T.E. කොටි 10 ක් මරුට"
- "රණවිරුවන් 10ක් මව්බිම වෙනුවෙන් දිවි පුදයි" යනුවෙනි.

මෙහිදී මෙම ප්‍රකාශයන් පුවත්පත්කරුගේ ආත්මීය ලක්ෂණ මත පදනම් වේ. කියවන්නා තුළ ද්වේෂය, වෛරය උපදවයි. එමෙන්ම එය දේශපාලනික වේ.

**ඉඩතැබීම**

ලිවීමේදී ඉඩතැබීම ඉතා වැදගත් වේ. ලියූ යමක් කියවීමේදී වචන අතර තබන ඉඩ අනුව ඒවායෙහි හඳුනා ගැනීමට පහසු වේ. ලිවීමේදී පමණක් නොව කථනයේදී ද ඉඩ තැබීම වැදගත් වේ. මක්නිසාද ශබ්ද බිහි කරන්නේ ඉඩ තැබීමෙන් ඇති නිශ්ශබ්දතාවයේ ප්‍රතිඵලයක් වශයෙනි.

උදා - 1. "මරන්න එපා, නිදහස් කරන්න."

2. "මරන්න, එපා නිදහස් කරන්න."

ඉඩ තැබීමෙන් ඉහත ප්‍රකාශ දෙකෙහි අර්ථයන් දෙකක් මතුකර පෙන්වයි.

**වචනවල ධූරාවලිය**

ඩෙරීඩාට අනුව ඕනෑම සම්ප්‍රදායක පවතින වචනවල ධූරාවලියක් පවතී. ඉන් එකක් ඉහළින් පවතින අතර අනෙක පහත් වේ.

උදා -

- සුදු - කළු
- ස්ත්‍රී - පුරුෂ
- හොඳ - නරක
- මිනිසා - දෙවියා
- ආලෝකය - අඳුර

මෙහිදී එක් වචනයක් ඉස්මතු වන අතර අනෙක යටපත් වේ. 'සුදු-කළු' යන්න ගත් විට සුදු යන්නෙහි වටිනාකම වැඩි බවක් ද කළු යන්නෙහි වටිනාකම අඩු බවක් ද අදහස් වේ. නමුත් සුදු යන්නට වටිනාකමක් ලැබෙන්නේ කළු වල පැවැත්ම නිසාය. මෙය භාෂා භාවිතයේදී අවබෝධ කරගත යුතුය. ඩෙරීඩාට අනුව මෙම වචන කියවිය යුත්තේ ඉහළ සිට පහළට නොව පහළ සිට ඉහළටයි. එනම් අර්ථය යටපත් වූ තැන සිට අර්ථය මතුවූ තැන දක්වායි.

**භාෂාවේ අර්ථය විසිරීම**

මෙය ඩෙරීඩා විසින් මානවයාගේ පාලනයෙන් විමුක්ත ක්‍රියාවලියක් සේ පිළිගැනීම සමස්ත භාෂා ක්‍රියාවලියම මානව පාලනයේ පරිබාහිර වූවක් සේ දැකීමට හේතු වී ඇත. ඩෙරීඩා මෙය පැහැදිලි කිරීමට “pharmacy” යන වචනයෙහි අර්ථය විසිරෙන ආකාරය දෙස අවධානය යොමු කර ඇත. ග්‍රීක බසින් pharmacy යන්නෙහි අර්ථය වන්නේ සුවකිරීම, ඖෂධ, විෂ, ඉන්ද්‍රජාලික යනාදිය වේ. එවිට පුද්ගලයන් දෙදෙනෙකු ගත් විට ඔවුන්ට මෙහි සංකල්ප දෙකක් සිහිවිය හැකිය. ඉන්ද්‍රජාලික යන්න මතක් වූවකුට සුරංගනා කථා, සුවඳ විලවුන්, මායාවන් ආදිය ද සිහිවිය හැකිය. මේ අනුව නිශ්චිත අර්ථයන් ගම්‍ය කරගත නොහැක. මෙම අර්ථ විසිරීම බහු කියවීම්වලට සමාන වේ. කලාව විවිධාකාරයේ අර්ථ නිරූපණය කළ හැකිය. කවියක් ගත් කල එක් එක් පාඨකයා එයට විවිධ අර්ථයන් සපයයි. මෙය එක් අතකින් රෝලන්ඩ් බාත්ගේ "කතෘ මරණයට" (Death of the Author) සමාන වේ.

**අනුපූරකය**

ආධිපත්‍යයෙන් තොර ලිවීම හා කියවීම මෙහි අදහස වේ. ලිවීම, වචන එකතු කිරීම් කළ හැකි දෙයක් විය යුතුය. පාඨකයන් ඉක්මවූ කියවීම් ග්‍රහණය කර ගැනීමටත්, එසේ කිරීමටත් ඉඩ දීමකි. මේ පිළිබඳ අදහස් හොප්කින්ස් දේශනය තුළ දක්වා ඇත. ඩෙරීඩියානු අනුපූරකය යනු නිරන්තරයෙන් එකතුවන සංඥා කරන ක්‍රියාවලියකි.

**ඩෙරීඩාගේ අදහස් කලාවේ ප්‍රගමනය සඳහා දැක්වූ දායකත්වය**

ලෝකයේ අනෙකුත් ධර්මතාවයන්ගේ වෙනස් වීමට සාපේක්ෂව විචාර කාර්යයද වෙනස් විය යුතුවේ. එම ධර්මතාවයට අනුව යමින් විචාරය සඳහා පශ්චාත් නූතනවාදී විචාර මාර්ගයක් බිහිවිය. ප්‍රංශ ජාතික ජැක් ඩෙරීඩා පශ්චාත් නූතනවාදී විචාර මාර්ගය විශ්ලේෂී අර්ථ විග්‍රහයක යෙදුණ චින්තකයෙකි. ඔහු සාහිත්‍ය විචාරය සඳහා නව විචාරාත්මක ක්‍රමවේදයක් ඉදිරිපත් කළේය. එනම් විසංයෝජනයයි.

මේ හරහා නිර්මාණයක මතුපිට අර්ථයට වඩා ගැඹුරු අර්ථයක් මතුකර ගැනීමට පමණක් නොව එකම නිර්මාණයක් දෙස විවිධ දෘෂ්ටිකෝණ තුළින් දැකීමේ හැකියාවද ලැබේ. එනම් නිර්මාණයක විවිධ අර්ථ නිරූපණය මඟින් ඉස්මතු කර ගත හැකි සාමාජීය සාකච්ඡාවන් මතුකර ගැනීමට විසංයෝජනය වැදගත් වේ. එනම් කර්තෘ විසින් යම් නිර්මාණයක් ඉදිරිපත් කරන්නේ ඔහුගේ පෞද්ගලික සිතිවිල්ලක් හෝ අත්දැකීමක් හරහා විය හැකිය. එවිට එය ආත්මීය වේ. පෞද්ගලික වූ නිර්මාණයකි. නමුත් එය පාඨකයා වෙත ලබාදුන් විට එහි පෞද්ගලිකභාවය ඉවත් වී පොදු නිර්මාණයක් බවට පත්වේ. එවිට එය වාස්තවික වේ.

විසංයෝජනය තුළින් සිදුවන්නේ ද සාහිත්‍ය නිර්මාණයක කර්තෘගේ ආත්මීය බවින් ඔබ්බෙහි වූ යථාර්ථයක් වෙත ගමන් කිරීමයි. ඒ හරහා ඉහළ රසවින්දනයක් ලැබේ. සාහිත්‍ය නිර්මාණයක් ජනසතු වූ පසුව කර්තෘ අයිතිය අහිමි වී යයි. එමෙන්ම කර්තෘගේ අභිමතාර්ථයන් ඉක්මවා සමාජ කතිකාවතක් බවට පත්වීමටද ඉඩ තිබේ. විසංයෝජනය හරහා සිදුවන්නේ මෙයයි.

සාහිත්‍ය විෂයෙහිලා විසංයෝජනය භාවිතා වන ආකාරය නිදසුන් කිහිපයක් ඇසුරින් විමසා බලමු.

"සමනල තටු" චිත්‍රපටයේ එන සෝමරත්න දිසානායකයන් විසින් රචිත "මේක සොඳුරු ලෝකයක්" නැමති ගීතය ගත හැකිය. මෙහි වස්තු විෂය වන්නේ ඉතා දුගී පවුලක් තුළ

සිටින මව, පියා, දැත් දෙපා අහිමි සහෝදරිය සහ සහෝදරයා ජීවත්වීමට අවශ්‍ය දෛනික වියදම සපයා ගැනීමට වීදියේ ගීත ගයන ආකාරයයි.

මේක සොඳුරු ලෝකයක් සතුටු සිනා පිරුණු සාදයක් //

මහතුනේ රැගෙන යන්න ඉන් බිඳක් //

ඇසට කඳුළු එපා සොඳුරු දසුන් බොඳවී යාවී

ළයට සුසුම් එපා සෙනෙහේ පැතුම් පිටවී යාවී

අපි නටමු ගයමු වයමු හිනාවී //

මේක සොඳුරු ලෝකයක්...

සුරලොවෙන් ඇදි සුර සැප අප නිබඳ හමාවී

පෙර පිනකින් අපේ මෙහෙම ලොවක උපත ලබා වී

මහතුනේ අපි නටමු ගයමු වයමු හිනාවී අපි නටමු ගයමු වයමු හිනාවී...

මේක සොඳුරු ලෝකයක් .........

මෙම ගීතයේ දැක්වෙන පවුල අතිශය දුප්පත්ය. පියා රෝගාතුරය. සහෝදරියගේ දැත් දෙපා අහිමිය. ගායනය සිදුවන්නේ මහ පාරේය. ගීතයෙන් ඔවුන් අපේක්ෂා කරන්නේ සුන්දර වූ, සතුටු සිනා පිරුණු ලෝකයකි. නමුත් සැබෑ ජීවිතය ඊට හාත්පසින් වෙනස් වූවකි. එකිනෙකට ගීතය හා සැබෑ ජීවිතය පරස්පරය. මෙහිදී භාවිතා වන විධික්‍රමය වන්නේ විසංයෝජනයයි.

ලක්ෂාන් අතුකෝරල විසින් රචිත "ගැහැනු" නම් කෙටි කවියද විසංයෝජන කියවීමට කදිම නිදසුනකි.

වැඩ ඇරී වැඩට

යති ගැහැනු

පළමු පෙළෙහි "වැඩ ඇරී" යන්නෙහි ඇත්තේ රැකියා ස්ථානයේ පවතින වැඩය. ඒවා අකමැත්තෙන් ඇය වෙත පැවරුණු රාජකාරී වේ. දෙවන පෙළෙහි "වැඩට යති" යනු

නිවෙසෙහි වැඩය. නමුත් මේවා ඇය සිය කැමැත්තෙන් පවරාගත් වැඩය. මෙහි 'වැඩ' යන්න බහු අර්ථ යෙදුමකි. එනම් විසංයෝජනාත්මක අදහසකි.

තවද මෙම "ගැහැනු" යන්නෙන් පිරිමින් ගැනද තවත් කියවීමක් ඉදිරිපත් කළ හැකිය. ගැහැනුන්ගේ වැඩ පිරිමින්ගේ වැඩ යනු පැහැදිලිව කොටස් දෙකකි. "ගැහැනු" යන කවියෙන් "පිරිමි" යන්නෙහි අර්ථය සඟවා තබයි. මෙය කියවන්නාට,

වැඩ ඇරී

ගෙදර එති පිරිමි

යනුවෙන් පිරිමියා පිළිබඳව සැඟවුණු අර්ථයක් ඉදිරිපත් කළ හැකිය.

තවත් නිදසුනක් ලෙස, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත සිංහබාහු නාට්‍යයෙහිද විසංයෝජනීය කියවීමක් ජනිත වේ.

පුතු සෙනේ පිතු හද තුළම මීස

නැත පුතුන් හද තුළ රඳන්නේ

ඇට තුළට වැද ඇට මිදුළු මත

සදා කල් නැත දුක් දෙවන්නේ

මෙහිදී එක් අතකින් ධාරක ස්නේහයෙන් පිරුණු සාධාරණ පියෙකුගේ චරිතයත්, අනෙක් අතින් භද්‍ර යෞවනයේ නිදහස සොයන දඟකාර, පියාට යටත්වී සිටීමට අකමැති පුතෙකුගේ චරිතයකි. මේ දෙස සාම්ප්‍රදායික දෘෂ්ටියකින් බලන්නෙකුට එකවරම පෙනෙන්නේ පුත්‍රයාගේ අකටයුතුකමය. නමුත් පියාගේ පාර්ශවයෙන් පියාත්, පුතාගේ පාර්ශවයෙන් පුතාත් සාධාරණ වේ. මෙහිදී එක් එක් චරිතයට සමාරෝපණය වී බැලූ විට මතුපිටින් පෙනෙන අර්ථය ඉක්මවා ගිය වෙනස්ම කියවීමකට මඟ පෙන්වයි.

එමෙන්ම මහාචාර්ය සරච්චන්ද්‍රයන් රචිත මනමේ නාට්‍යය ගත් විට,

දිරියෙන් යුදකළ - ඔබ දුටු වේලේ

මොහොතින් සිත මා - පිරුණයි ආලේ

වනයේ නෙක බිය - පහව යමින්නේ

චංචල වූ සිත - සැනසුම වින්දේ

නැතිමුත් රජකම - ඔබමයි පතන්නේ

ඇත මට හිමගිර - ඔබ සමඟින්නේ

මෙහිදී කෙනෙකුට මනමේ කුමරිය තම සැමියාට එරෙහි වූ අසම්මත ගැහැනියක් විය හැකිය. නමුත් කුඩා කල සිටම රජ මැදුරක රාජ නීති යටතේ හැදී වැඩී, යෞවනයේ ප්‍රේමයේ පහස නොවිඳ පිය රජුන්ගේ කැමැත්තට විවාහ පත් යුවතියකි. තම දියණියගේ විවාහය සම්බන්ධයෙන් ඇයගේ කැමැත්ත හෝ ඇයගේ මවගේ අදහස විමසන්නේ නැත. පියාගේ කැමැත්ත මත විවාහය සිදු වේ.

මනමේ කුමරු වනය මැදින් යන විට ආල වදන් පැවසුව ද මනමේ කුමරිය පවසන්නේ ස්වභාව සෞන්දර්ය පිළිබඳවයි. ඉන් අදහස් වන්නේ විවාහය සම්බන්ධව ඇයගේ කැමැත්තක් නොමැති බවයි. පුරුෂාධිපත්‍ය සහිත දෘෂ්ටියකින් බැලූ විට මනමේ කුමරිය තම ස්වාමියාට ද්‍රෝහී වූ ස්ත්‍රියකි. නමුත් ස්ත්‍රීවාදී දෘෂ්ටියකින් මේ දෙස බැලූ විට මනමේ කුමරියට අසාධාරණයක් වී ඇති බවත්, කිසිදු සමාජ අත්දැකීමක් නොමැති අය මෙම අවස්ථාවට මුහුණ දුන් ආකාරය පිළිබඳව ඇය කෙරෙහි අනුකම්පාවක් ද ඇති වේ. එක් අතකින් මෙය පටාචාරා කථා වස්තුව සමඟ ද ගැලපේ. මෙහි දී සිදුවන්නේ එකම චරිතය පිළිබඳව විවිධ දෘෂ්ටිකෝණ ආශ්‍රයෙන් විමසා බැලීමකි. මතුපිට කියවීමට ලඝු නොවී ඉන් එහා ගිය තත්ත්වයක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙය එක්තරා විසංයෝජනීය කියවීමකට ලක් කළ හැකිය.

එමෙන්ම විසංයෝජන දැක්වීමට තවත් නිදසුන් ලෙස අශෝක හඳගමගේ INI AVAN චිත්‍රපටය සහ ප්‍රසන්න විතානගේ අධ්‍යක්ෂණය කළ "ගාඩි" චිත්‍රපටය ගත හැකිය. 'ඉනි අවන්' චිත්‍රපටයේ සුවිශේෂත්වය වන්නේ එය පශ්චාත් යුද ප්‍රථම ශ්‍රී ලාංකික දෙමළ චිත්‍රපටය වීමයි. මෙහිදී යුද්ධය හා සම්බන්ධ ඍජු දේශපාලනයක් ඉස්මතු කෙරේ. මෙහි ප්‍රධාන චරිතය වන්නේ පුනරුත්ථාපනයෙන් පසු ගමට එන L.T.T.E. සන්නද්ධ සාමාජිකයෙකුගේ පශ්චාත් යුද සමාජ ජීවිතයයි. මෙහි කථා සාරාංශය වන්නේ යුද්ධය නිමවීමත් සමඟ හමුදාව විසින් අත්අඩංගුවට ගනු ලැබූ නැතහොත් හමුදාවට බාර වූ L.T.T.E. සන්නද්ධ සාමාජිකයෙකු පුනරුත්ථාපනයෙන් පසු ගමට පැමිණීමත් ඉන් අනතුරුව ඔහු මුහුණ දෙන කෙළවරක් නොමැති අකරතැබ්බයන් පිළිබඳවයි. එමෙන්ම පුනරුත්ථාපනයේ අර්ථ ශූන්‍ය බව, පුනරුත්ථාපනය වීමෙන් පසුව එම පුද්ගලයා සමාජයෙන් කොන්වන ආකාරය මෙන්ම ක්‍රමක්‍රමයෙන් ඔහු සමාජයට අනුගත වන ආකාරය මෙයින් නිරූපිතය. චිත්‍රපටය යුදකාලය පසුබිම් කරගත් චිත්‍රපටයකි. යුද සමයෙහි ප්‍රධාන සංකේතය වන්නේ රණවිරුවන්ය. නමුත් මේ චිත්‍රපටය තුළ රණවිරුවන් දක්නට ලැබෙන්නේ නැත. මෙහි අනුපූරක දෘෂ්ටිය දක්නට ලැබේ.

ගාඩි චිත්‍රපටයේ කථා සාරාංශය වන්නේ මහනුවර රාජධානි ක්‍රමයේ ක්‍රියාත්මක වූ කුල ධූරාවලියයි. ගාඩි හෙවත් රොඩී යනු කුල ධූරාවලියෙහි පහත්ම ජන කොටසයි. කුලය,

අනන්‍යතාවය, මානුෂීයත්වය මෙන්ම බලයට ඇති තෘෂ්ණාව මත ක්‍රූරත්වයට පත්වන මිනිසුන්ගේ චරිතයන් හා බැඳුණු කතාවක් මෙහි නිරූපිත වේ. එකල සමාජ ක්‍රමය තුළ කුලය දේවත්වයෙන් සලකන අතර කුලයෙන් පහත් වීමට වඩා මරණය සුදුසුය යන්න එකල මිනිස් මානසිකත්වය තුළ මුල් බැසගත් අදහසකි. මහනුවර රාජධානියේ ප්‍රධාන සංකේතය දළදා මාළිගාවයි. එනම් බෞද්ධ සංස්කෘතියයි. බුදුරජාණන් වහන්සේ කුල භේදය ප්‍රතික්ෂේප කරයි. නමුත් මහනුවර රාජධානි සමයේ කුල භේදය සමාජයේ ඉහළින්ම සටහන් වේ. බුදුන් ප්‍රමුඛ වූ දළදා වහන්සේ වැඩවසන මහනුවර රාජධානි ක්‍රමය තුළ බුදුන් ප්‍රතික්ෂේප කළ කුල ක්‍රමයට ඉහළ වැදගත්කමක් ලබා දීම පරස්පර විරෝධී වේ. ප්‍රතිවිරුද්ධ අදහස් මින් ජනිත වේ. එමෙන්ම මහනුවර රාජධානි යුගය තුළ සමාජ වටපිටාවක් නිරූපණය කරන "ගාඩි" චිත්‍රපටයේ ද මහනුවර යුගයේ ප්‍රධාන සාධකය වූ භික්ෂුව නැමති පදනම් සාධකය ඉවත් කර ඇත. මින් පෙනෙන්නේ යුගයේ පූර්ණ ආධිපත්‍ය දරන සාධකය ඉවත් කිරීමයි. මෙහිද ඩෙරීඩියානු විසංයෝජනය පෙන්නුම් කරයි.

මීට අමතරව "අක්ෂරය" චිත්‍රපටය හා "තනි තටුවෙන් පියඹන්න" අශෝක හඳගමගේ චිත්‍රපට ද්විත්වය ගතවිට;

"අක්ෂරය" චිත්‍රපටයේ කථා සාරාංශය ගතහොත්, කොළඹ පැරණි සුවිසල් මැදුරක විශ්‍රාමික මහේස්ත්‍රාත්වරයෙකු ඔහුගේ බිරිඳ වන මහේස්ත්‍රාත්වරියක වාසය කරන අතර ඔවුන්ගේ කතාව සමඟ සම්බන්ධ වූ නගරයේ විසූ වෛශ්‍යාවකගේ මරණය සම්බන්ධ අතුරු කතාවක් ද මෙහි අධියථාර්ථවත් ව දිග හැරෙයි. අගනගරයේ ජනප්‍රිය පාසලක ඉගෙන ගන්නා නඩුකාර පුත්‍රයා අසභ්‍ය ඡායාරූප නරඹමින් සිටින අතරතුර ගුරුවරියට හසු වේ. දඬුවමට බියෙන් දිව යන ඔහු අතින් පාළු ගොඩනැගිල්ලක සිටි වෛශ්‍යාවක මියයයි. ජනමාධ්‍ය මෙම සිදුවීමේ තොරතුරු හෙළි කරගැනීම පිණිස හඹා යයි. විනිසුරුවරිය වන අම්මා හා පුතා අතර දැඩි සම්බන්ධතාවයක් ඇති අතර පියා මනෝ ලෝකයකට සීමා වී දිවි ගෙවයි. පලා යන දරුවා කෞතුකාගාරයේ සැඟවෙයි. කෞතුකාගාරයේ මුරකරුවා හා ඔහුගේ දියණිය සමඟ නඩුකාර පුත්‍රයා ඔවුන්ගේ තට්ටු නිවාසයට යයි. විනිසුරුවරිය දරුවා සඟවා තබන ලෙස මුරකරුවාට මුදල් දෙයි. මේ අතර විනිසුරුවරියගේ අතීත කතාව හෙළි වේ. ඇගේ සැමියා සිය දරුවාගේ පමණක් නොව තමාගේ ද පියා බව හෙළි කරයි. ඇගේ මව වලව්වේ ආයා ලෙස සේවය කරන කාලයේ පටන් කතාව ඇරඹී ඇත. මියගිය වෛශ්‍යාවගේ කතාව රූපවාහිනී කතාවක් සේ විශ්‍රාමික විනිසුරුවරයා ම නරඹන ලෙස ගොතා ඇත. සියල්ල යථාර්ථයට පිටින් මායාවී ලෙස ගළපා තිබෙන අතර

කෞතුකාගාරය, මව හා පුතා අතර සම්බන්ධතාවය, නිෂ්ක්‍රීය පියා, මුරකරුවාගේ පිරිමි පෞරුෂය මනෝවිශ්ලේෂණ දෘෂ්ටියක සිට දිග හැරෙයි. අවසානයේ කෞතුකාගාරය තුළ විනිසුරුවරිය කලබලයක් කරන අතර මුරකරුවා අතින් ඇය දූෂණය වේ. තට්ටු නිවාසයේ පියගැටපෙළ නැග එන ඇයට සිය පුතා අතින්ම වැරදීමකින් පිහි පාරක් එල්ල වේ. ඇය මිය යයි. දරුවා පලා යයි. ඔහු නගරයේ මඟ සොයමින් දිව යයි.

මෙහි විසංයෝජනයේ භාවිතය ගත් විට 'අක්ෂරය' චිත්‍රපටය තුළ ද්විමය ප්‍රතිපක්ෂ අතර බෙදුම් රේඛාව දිය කර දමා ඇති අතර එය විසංයෝජනය සිනමාත්මකව යොදාගත් අවස්ථාවකට ප්‍රශස්ත උදාහරණයකි. ද්විමය ප්‍රතිපක්ෂයන්ගේ පැවැත්ම පිළිගැනීම හෝ ඒ මත කලාකෘති නිර්මාණය නූතනවාදී වන අතර, ද්විමය ප්‍රතිපක්ෂයන්ගේ සීමාව බොඳ කර දැමීම පශ්චාත් නූතනවාදී කලා කෘතිවල ලක්ෂණයකි. චිත්‍රපටයේ දැකගත හැකි ප්‍රධාන ද්විමය ප්‍රතිපක්ෂ කිහිපයකි,

| | | |
|---|---|---|
| ප්‍රබන්ධය | - | යථාර්ථය |
| ස්ත්‍රිය | - | පුරුෂයා |
| නීතිය | - | ප්‍රකෘතිය |
| ඉතිහාසය | - | වර්තමානය |
| ධනපතියා | - | නිර්ධනයා |
| බිරිඳ | - | සැමියා |

'අක්ෂරය' චිත්‍රපටය තුළ මෙකී සහසම්බන්ධ ප්‍රතිපක්ෂයන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට නොහැකිය. දරුවා වෛශ්‍යාවට පිහියෙන් අනින දර්ශනය ගෙන එන්නේ මෙම ප්‍රබන්ධයත් යථාර්ථයත් අතර බෙදුම් රේඛාව බොඳ කර දමමිනි. විශ්‍රාමලත් මහේස්ත්‍රාත්වරයා තම දරුවා සඟවා තිබෙන තට්ටු නිවාසය වෙත යාම නිරූපණය කරන්නේ රූපවාහිනියේ දැක්වෙන මෝටර් රථ ධාවන තරඟයක රූප රාමු මඟිනි. මෙය පශ්චාත් නූතන සමාජයේ ජනමාධ්‍යයේ නිරූපණයයි.

'තනි තටුවෙන් පියඹන්න' චිත්‍රපටය ගත් විට, චිත්‍රපටය තුළ පාත්‍ර වර්ගයාගේ නමක් හෝ ගමක් සඳහන් වන්නේ නැත. ප්‍රධාන චරිතය වන්නේ පිරිමි වෙසක් ගත් ගැහැනියකි. ඇය පිරිමියෙකු බව සිතන රැකියාව කරන ස්ථානයේ සමලිංගික තරුණයෙකු ඇයව නතු කර ගැනීමට උත්සාහ කරයි. රැකියා ස්ථානයේ සිදුවන අනතුරක් හේතුවෙන් සමලිංගික තරුණයා විසින් ඇයව ගබ්සා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යමින් සිටින වෛද්‍යවරයෙකු වෙත රැගෙන යයි. එහිදී ඇය පිරිමියෙකු නොව ගැහැනියක බව වෛද්‍යවරයා හට

අනාවරණය වෙයි. මෙම ගැහැනිය පිළිබඳ සිතක් ඇතිකරගත් වෛද්‍යවරයා ඇය වසඟ කර ගැනීමට අවස්ථා කිහිපයකදී උත්සාහ කරයි. එය සාර්ථක නොවන තැන්හි ඇය රැකියාව කරන ස්ථානයේ ආයතන ප්‍රධානියාට මේ පිළිබඳව දැනුම් දෙයි. මේ නිසා ඇය විසින් ගොඩනගාගත් ලෝකය බිඳී විසිරී යාමටත්, සමාජ නිග්‍රහයට පත්වන්නටත් පටන් අතර එයින් කෝප ගැන්වුණු ඇය වෛද්‍යවරයා ඝාතනය කරයි.

තනි තටුවෙන් පියඹන්න චිත්‍රපටය සඳහා පශ්චාත් නූතනවාදී කියවීමක් සඳහා අවස්ථා විවෘත කරයි. එහි ප්‍රකාශිත පශ්චාත් නූතන ලක්ෂණ පිළිබඳව විග්‍රහයක් යම් යම් තලයන්හි යම්කිසි මට්ටමකින් සිදුවී තිබෙනු දැකගත හැකි විය.

මෙහි විසංයෝජනයේ භාවිතය ලෙස, 'ගැහැනිය' සහ 'පිරිමියා' යන ද්විමය ප්‍රතිවිරෝධය ක්‍රියාත්මක වන ආකාරයත් එහි සීමාහරණය වීමත් "තනි තටුවෙන් පියඹන්න" චිත්‍රපටයේ දක්නට ලැබෙන අතර එය මෙහි විසංයෝජනය ක්‍රියාත්මක වන අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. මෙය පුරුෂ මූලික සමාජ චින්තනයේ පුරුෂයා සතු ප්‍රචණ්ඩ ධූරාවලිය බිඳහෙළන අවස්ථාවක් ලෙස තවදුරටත් හඳුනාගත හැකිය. සාම්ප්‍රදායිකව ගැහැනිය අර්ථකථනය කරනුයේ පිරිමි ගතිගුණවලට පර්යාය ගතිගුණ ඇත්තියක ලෙසය. එනම් ගැහැනිය යනු පිරිමියා නොවේ යනුවෙනි. පිරිමියෙකුට කළ හැකි බොහෝ දේ ගැහැනියකට කළ නොහැකිය. එම නොහැකියාවන් සාමාජීය වශයෙන් ගොඩනගා ඇති අතර ජීව විද්‍යාත්මකව ද එය නිරායාසයෙන් ගොඩනැගී ඇත. එම අර්ථකථන නිරන්තරයෙන් පුරුෂ පාර්ශ්වයට පක්ෂපාතී ලෙස ගොඩනැගී ඇත. ගැහැනිය එයට අනුගත විය යුතු ලෙස සියලු සමාජ ආයතනයන් සැකසී ඇත.

| **පිරිමියා** | **ගැහැනිය** |
|---|---|
| බුද්ධිමත් | භාවමය |
| ශක්තිමත් | දුර්වල |
| විශ්වාසදායක / ස්ථිර | අවිශ්වාස / චපල |
| ඉවසන | ඉවසීමේ ශක්තිය හීන |
| සියල්ලටම එරෙහිව ක්‍රියාත්මක වන | සියල්ල විඳ දරා ගන්නා |
| පාලනය කරන | පාලනය වන |

“තනි තටුවෙන් පියඹන්න” චිත්‍රපටයේ නිරූපණය වන ගැහැනියගේ සහ පිරිමියාගේ ලක්ෂණ ඉහත ආකාරයෙන්ම විය. චිත්‍රපටයේ වෛද්‍යාවරයා හමුවීමට පැමිණෙන්නේත්, ගරාජයේ රැකියා සොයා පැමිණෙන්නේත්, රැකියාව පවත්වා ගැනීම සඳහා අතවරයන්ට ලක්වන්නේත්, පියාගේ සහ සැමියාගේ ආධිපත්‍යය තුළ ජීවත් වන්නේත් එම ගැහැනියයි. නමුත් මෙය ඛණ්ඩනය වන්නේ මෙහි ප්‍රධාන චරිතය පිරිමියෙකු ලෙස වෙස් වළා සිටින ගැහැනියක වීමෙනි. ඇයගේ අශීල හැසිරීම ගැහැනිය දැකීමට ප්‍රිය වස්තුවකි යන මතයට ප්‍රතිවිරුද්ධ අදහසක් ඉදිරිපත් කරයි. එමෙන්ම සාම්ප්‍රදායික අර්ථකථන සම්මුතීන් මගින් තවදුරටත් ස්ත්‍රිය පාලනය කළ නොහැකිය යන මතය නිරූපණය කරයි. චිත්‍රපටයෙහිද සාම්ප්‍රදායිකව ගැහැනිය අපේක්ෂා කළ ආකාරයට ප්‍රතිවිරුද්ධ හැසිරීම් පිරිමි වෙස්ගත් ගැහැනිය නිරූපණය කරන අතර පිරිමියා සහ ගැහැනිය යන ද්විමය ප්‍රතිවිරෝධය සීමාහරණය කරයි.

**නිගමනය**

ඉහත කාරණා සියල්ල දෙස අවධානය යොමු කිරීමේදී බටහිර දර්ශනය තුළ සාහිත්‍ය විචාර කලාව කෙරෙහි නවතම අදහස් ඉදිරිපත් කරමින් සාහිත්‍ය නිර්මාණයක් විචාරය කිරීමේදී එන නවතම මාවතකට ගෙන යන ලද ජැක් ඩෙරීඩා වැදගත් වේ. ඔහුගේ ප්‍රධාන සංකල්පනාව වන්නේ විසංයෝජනයයි. විසංයෝජනය යන්නට නිශ්චිත නිර්වචනය ලබා දිය නොහැක. නමුත් සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන විචාර මූලධර්මයන් ලෙස හඳුනාගත හැකිය. සරල අර්ථයෙන් ගත් විට විසංයෝජනය පිළිබඳ ඩෙරීඩාගේ තර්කය වන්නේ කිසිම දෙයක තනි නිසර්ග අර්ථයන් නොමැති බවයි. එමෙන්ම විසංයෝජනය යන්න පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයන් ලෙසත් මතුපිටින් පෙනෙන අර්ථය ප්‍රතික්ෂේප කරමින් සැඟවුණු අර්ථ සොයා ගැනීමක් ලෙසත් විග්‍රහ කළ හැකිය. විසංයෝජනය තුළින් කතුවර අපේක්ෂකත්වයෙන් තොරව පාඨකයාගේ අදහස අනුව නිර්මාණයක් දෙස බැලිය හැකි වේ. මින් පෙනී යන්නේ විසංයෝජනය අනන්ත කියවීම් හමුවේ නව ඉදිරිපත් කිරීම් කෙරෙහි යොමුවන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අබේවික්‍රම එල්. රංජිත්. (2011). *පශ්චාත්නූතනවාදී විචාර ව්‍යුහය*, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

කුමාරසිංහ, කුලතිලක. (2010). *පශ්චාත්නූතනවාදය හා සාහිත්‍ය විචාර න්‍යාය*, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

රත්නායක, මනෝජ් ප්‍රසන්න. (2011). *පශ්චාත්නූතනවාදය*, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

දිසානායක, විමල්. (2010). *නව විචාර සංකල්ප*, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

දිසානායක, විමල්. (2006). *පශ්චාත් නව්‍යවාදය: කෙටි හැඳින්වීමක්*, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

පතිරණ, මහින්ද. (2008). *පශ්චාත්නූතනවාදය: වළ සහ විල*, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

එදිරිසිංහ, දයා සහ පෙරේරා ඥානදාස. (2008). *දාර්ශනික විමර්ශන*, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල.

Aesthetics and Philosophy of Art. (2012). *The Journal of Speculative Philosophy*, *26*(2), 361–393. https://doi.org/10.5325/jspecphil.26.2.0361

Bennington, G. (2014). Aesthetics Interrupted: the Art of Deconstruction, 36(1).https://doi.org/10.3366/olr.2014.0084

McEvilley, T. (2006). Modernism, Post-Modernism, and the End of Art. *New England Review (1990-)*, *27*(1), 129–148. http://www.jstor.org/stable/40244793

Nealon, J. T. (2006). Post-Deconstructive? Negri, Derrida, and the Present State of Theory. *Symplokē*, *14*(1/2), 68–80. http://www.jstor.org/stable/40550715

Nuyen, A. T. (1989). Derrida's Deconstruction: Wholeness and Différance. *The Journal of Speculative Philosophy*, *3*(1), 26–38. http://www.jstor.org/stable/25669901

Norris, C. (1988). Deconstruction, Postmodernism and Philosophy: Habermas and Derrida, 426-446.https://www.ceeol.com/search/article-detail?id=50489

Shusterman, R. (1986). ANALYTIC AESTHETICS, LITERARY THEORY, AND DECONSTRUCTION. *The Monist*, *69*(1), 22–38. http://www.jstor.org/stable/27902950